අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

කාලය පැය 03 යි
සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

1. 57 යන දශමය සංඛ්‍යාවට තුල්‍යවන ද්විමය (Binary) සංඛ්‍යාව වනුයේ,
   (1) 11101 (2) 101001 (3) 111001 (4) 100100

2. 1111 යන ද්විමය සඛ්‍යාවට තුල්‍යවන අෂ්ටක (Octal) සංඛ්‍යාව වනුයේ,
   (1) 17 (2) 111 (3) 19 (4) 33

3. ෂඩ්දශමක (Hexadecimal) සංඛ්‍යා පද්ධතියේ පාදය වනුයේ,
   (1) 2 (2) 8 (3) 10 (4) 16

4. 101010 සහ 110 යන ද්විමය සංඛ්‍යා දෙකෙහි එකතුව වනුයේ,
   (1) 101010110 (2) 1011111 (3) 110000 (4) 101011

5. නිබල් 1 (1 Nibble) ක් තුල්‍ය වනුයේ,
   (1) බිටු 2 (2 bits) (2) බිටු 4 (4 bits) (3) බයිට 2 (2 bytes) (4) බයිට 4 (4 bytes)

6. A.(B+C) යන තාර්කික ප්‍රකාශනය සර්වසම වන්නේ පහත කවරකට ද?
   (1) A (2) A.B.C (3) (A.B)+(A.C) (4) A.B+C

7. පහත දී ඇති සත්‍යතා වගුව හා අදාළ තාර්කික මෙහෙයුම කුමක් ද?

Input 1	Output
0	1
1	0

   (1) NOR (2) NOT (3) AND (4) OR

8. පහත දී ඇති තාර්කික පරිපථයේ A හා B වල තාර්කික අගයයන් පිළිවෙලින් මොනවා ද?



   (1) 1 හා 1 (2) 0 හා 0 (3) 0 හා 1 (4) 1 හා 0

9. BCD යනුවෙන් ප්‍රකාශ වනුයේ,
   (1) Binary Coded Decimal (2) Bit Coded Decimal
   (3) Binary Coded Denominator (4) Byte Computer Deviation

www.onlinejobs.lk

10. පහත ඒවායින් කවරක් පද්ධති ජීවන සැලසුම් චක්‍රයේ (SDLC) අවධියක් නොවන්නේද ?
(1) සැලසුම් කිරීම (Planning)
(2) පද්ධති විශ්ලේෂණය (Analysis)
(3) පද්ධති සැලසුම් නිර්මාණය කිරීම (Design)
(4) පද්ධති විගණනය (Auditing)

11. පාරිභෝගිකයින්ගෙන් ලැබෙන ඇණවුම් වැනි දෛනික ගනුදෙනු (Transactions) පිළිබඳ තොරතුරු පවත්වා ගෙන යාම සඳහා උපකාරී වන තොරතුරු පද්ධතිය වනුයේ,
(1) කළමනාකරණ තොරතුරු පද්ධතිය (Management Information System)
(2) තීරණ සහායක තොරතුරු පද්ධතිය (Decision Support System)
(3) විධායක තොරතුරු පද්ධතිය (Executive Information System)
(4) ගනුදෙනු සැකසුම් පද්ධතිය (Transaction Processing System)

12. පද්ධති ජීවන සැලසුම් චක්‍රයේ (SDLC) සැලසුම් අවධිය (Planning) හා අදාළ නොවනුයේ,
(1) වැඩිදියුණු කිරීමට නියමිත පද්ධතිය අර්ථ දැක්වීම
(2) තාක්ෂණික පරිසරය නිර්මාණය කිරීම
(3) ව්‍යාපෘති සැලසුම නිර්මාණය කිරීම
(4) ව්‍යාපෘති විෂයය (Scope) හඳුනා ගැනීම

13. පද්ධති ජීවන සැලසුම් චක්‍රයේ (SDLC) අනුයාත අවධි තුනක් දැක්වෙන පිළිතුර වනුයේ,
(1) සැලසුම් කිරීම (Planning), විශ්ලේෂණය (Analysis), සැලසුම් නිර්මාණය කිරීම (Design)
(2) සැලසුම් කිරීම (Planning), ක්‍රියාවේ යෙදවීම (Implementation), පරීක්ෂාව (Testing)
(3) සැලසුම් කිරීම (Planning), සැලසුම් නිර්මාණය කිරීම (Design), වැඩිදියුණු කිරීම (Development)
(4) විශ්ලේෂණය (Analysis), සැලසුම් නිර්මාණය කිරීම (Design), ක්‍රියාවේ යෙදවීම (Implementation)

14. පරිගණක පද්ධතියක මූලික සංරචක දැක්වෙන පිළිතුර වනුයේ,
(1) දෘඪාංග (Hardware), මෘදුකාංග (Software), ජීවාංග (Liveware)
(2) කළමනාකරණ තොරතුරු පද්ධතිය (Management Information System), නිපුණ පද්ධතිය (Expert System), ගනුදෙනු සැකසීම් පද්ධතිය (Transaction Processing System)
(3) ආදානය (Input), ප්‍රතිදානය (Output), සැකසීම (Processing)
(4) ඒකක පරීක්ෂාව (Unit testing), පද්ධති පරීක්ෂාව (System testing), ආකලන පරීක්ෂාව (Integration testing)

15. Windows XP මෙහෙයුම් පද්ධතියේ ආරම්භක මෙනුවෙන් 'run' විධානය තෝරා එයට cmd ලෙස ලබාදුන් විට පහත කවරක් සිදුවේ ද?
(1) දෝෂ පණිවිඩයක් ලැබේ.
(2) විධාන ප්‍රේරක කවුළුව (Command Prompt Window) විවෘත වේ.
(3) කිසිවක් සිදු නොවේ.
(4) cmd ලෙස ගොනු නාමය ඇති ගොනු සොයා දෙයි.

16. පහත දැක්වෙන්නේ මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හි ලබා ගත හැකි මෙවලම් තීරුවකි (Tool bar). එය කුමක් ද?



(1) Formatting
(2) Drawing
(3) Standard
(4) Tables & Borders

17. මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) මගින් ලේඛයක් සුරැකීමේ දී භාවිතාවන මෙනු විකල්ප මොනවා ද?
(1) File → Save
(2) Open → File → Save
(3) File → Open → Save
(4) Insert → File → Save

www.onlinejobs.lk

18. මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හි ලේඛයක් වරකට සම්පූර්ණ තිර දර්ශනයකින් චලනය කරවීම සඳහා පහත කුමක් කළ යුතු ද?
(1) Page up, Page down යතුරු එබීම
(2) හැඩතල ගැන්වීම් තීරුවේ (Formating tool bar) අංක සහිත අයිකන මත ක්ලික් කිරීම
(3) රෝල් තීරුවේ (Scroll bar) උඩ සහ යට ඇති ඊ හිස් මත ක්ලික් කිරීම
(4) ඉහත 1 හා 2

19. ඇල්ගොරිද්ම (Algorithms) පාලන ව්‍යුහයන්ගෙන් (Control Structures) සමන්විත වේ. පහත ඒවායින් කවරක් පාලන ව්‍යුහ සඳහා උදාහරණයක් නොවන්නේ ද?
(1) ව්‍යාජ කේත (Pseudo codes) (2) පුනරාවර්තන (Iteration)
(3) අනුක්‍රමය (Sequence) (4) වරණ (Selection)

20. ජනප්‍රිය වෙබ් පිටු සඳහා දිනපතා මිලියන ගණනින් ..... ලැබේ.
(1) වැදුම් (Hits) (2) චිත්‍රක (Graphics) (3) ටැග (Tags) (4) තැපැල (Posts)

21. මයික්‍රොසොෆ්ට් ඇක්සස් (Microsoft Access) හි දත්ත සමුදායකට (Database), දත්ත ඇතුළු කෙරෙන සාමාන්‍ය ක්‍රමය වන්නේ,
(1) පෝරම (Form) (2) ගොනු (File)
(3) පසුරු පුවරුව (Clip board) (4) මෙවලම් ක්ෂේත්‍ර (Tool field)

22. දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක් මගින් පහත කවර කාර්යයක් ඉටු කර ගත හැකි ද?
(1) වගු නිර්මාණය කිරීම (2) දත්ත ඇතුළු කිරීම හා වෙනස් කිරීම
(3) දත්ත දැක බලා ගැනීම (4) ඉහත සියල්ල

23. එක් වගුවකින් තවත් වගුවකට යොමුවක් (Reference) ඇති කිරීමේ දී අවශ්‍ය වන යතුරු වර්ගය වන්නේ,
(1) ප්‍රාථමික යතුර (Primary key) (2) අසහාය යතුර (Unique key)
(3) අපේක්ෂක යතුර (Candidate key) (4) අන්‍ය යතුර (Foreign key)

24. මයික්‍රොසොෆ්ට් එක්සෙල් (Microsoft Excel) පැතුරුම්පතක (Spreadsheet), A10 කෝෂයේ (A1/A2)+A3 සූත්‍රය අන්තර්ගත වී ඇත. පහත දී ඇති A1, A2, A3 කෝෂ අගයයන් සඳහා A10 කෝෂයේ දර්ශනය විය යුතු අගය කුමක් ද?

Cell	Value
A1	15
A2	5
A3	1.5

(1) 4.5 (2) 9.5 (3) 7.5 (4) 4.75

25. පැතුරුම්පතක (Spreadsheet) තෙවන තීරුව හා හයවන පෙළ ඡේදනයෙන් ලැබෙන කෝෂයේ ලිපිනය විය යුත්තේ,
(1) 36 (2) C6 (3) 63 (4) 6C

පහත දී ඇති පැතුරුම්පත අධ්‍යයනය කර 26, 27 හා 28 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



	A	B	C	D	E	F	G
1							
2			University of Liverpool Sports Day				
3							
4		Department/ Points					
5							
6	Sport	Computing	History	Languages	Engineering	Law	
7	Cricket	200	100	50	120	90	
8	Basketball	300	200	300	200	190	
9	Table Tennis	400	300	200	300	200	
10	Tennis	100	120	400	100	300	
11	Archery	250	400	200	450	100	
12	Total	1250	1120	1150	1170	880	
13							
14							
15				Total Points	5570		
16							
17							

www.onlinejobs.lk

26. C12 කෝෂයේ අඩංගු විය යුතු සූත්‍රය/ශ්‍රිතය වනුයේ,
(1) = C7*C11 (2) = SUM (C6:C11) (3) = SUM (C7:C11) (4) = SUM (C7:C12)

27. E6 කෝෂයේ අඩංගු වන්නේ,
(1) ලේබලයකි (Label)
(2) අගයකි (Value)
(3) සූත්‍රයකි (Formula)
(4)සිරස්තලයකි (Heading)

28. E15 කෝෂයේ අඩංගු විය යුතු සූත්‍රය/ශ්‍රිතය වනුයේ,
(1) = B12*F12 (2) = SUM (B7:F12) (3) = SUM (B12:F12) (4) = B7:F11

29. පහත ඒවායින් පැස්කල් (Pascal) හි යොදා ගත හැකි වලංගු අනන්‍යකාරකයක් (Identifier) වනුයේ,
(1) time (2) costx2 (3) cost two (4) beta

30. පැස්කල් (Pascal) සමග යොදා ගත හැකි විචල්‍ය වර්ගයක් නොවනුයේ,
(1) Char (2) Fixed (3) Integer (4) Boolean

31. පැස්කල් (Pascal) වැඩසටහනක් සඳහා දත්ත ආදානය (Input) කිරීමට, එහි පළමු පෙළ විය යුත්තේ,
(1) Program First Program (Input);
(2) Programs Program (Input, Output) ;
(3) Program (Input, Output)
(4) Program First Program (Input, Output)

32. If – then සහ Case ආකෘති පහත කවරකට උදාහරණ වේද?
(1) ස්වයං ගවේෂණ (Heuristics)
(2) ඇල්ගොරිද්ම Algorithms)
(3) කොන්දේසිගත වගන්ති (Conditional statements)
(4) Goto වගන්ති

33. 'නූතන පරිගණකයේ පියා' ලෙස විරුදාවලිය ලැබී ඇත්තේ කා හටද?
(1) බිල් ගේට්ස් (Bill Gates)
(2) චාල්ස් බැබේජ් (Charles Babbage)
(3) ඇඩා ලෝවිලස් (Ada Lovelace)
(4) ඇලන් ටියුරින් (Alan Turing)

34. පවර්පොයින්ට් ගොනුවක් (Powerpoint file) සුරැකීමේ දී ..... ගොනු ආකාරය ලෙස යොදා ගත් විට, එය Internet Explorer හෝ Netscape Navigator වැනි බ්‍රවුසරයක් මගින් විවෘත කර දර්ශනය කර ගත හැක.
(1) සැලසුම් ආකෘතිය (Design Template)
(2) HTML
(3) Outline/RTF
(4) වින්ඩෝස් පාර ගොනුව (Windows Metafile)

35. පහත උපක්‍රම (Devices) අතුරින් ආදාන උපක්‍රමයක් (Input device) ලෙස පමණක් ක්‍රියාකරන්නේ,
(1) ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Projector)
(2) ෆැක්ස් යන්ත්‍රය (Fax machine)
(3) යතුරු පුවරුව (Keyboard)
(4) නම්‍යතැටි ධාවකය (Floppy drive)

36. පරිගණක ජාලයක දත්ත සහ වැඩසටහන් ගබඩා කර ඇති විශේෂිත පරිගණකය කවර නමකින් හැඳින්වේ ද?
(1) ඩ්‍රීම්කාස්ට් (Dreamcast)
(2) සර්වරය (Server)
(3) නාභිය (Hub)
(4) ප්ලේස්ටේෂන් (Playstation)

37. දත්ත රක්ෂිතයක් (Backup) යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) මෘදුකාංග අඩංගු තැටියකි
(2) දත්ත අඩංගු තැටියකි
(3) දත්ත හෝ මෘදුකාංග ගොනුවල සර්වසම පිටපතකි
(4) ඉහත කිසිවක් නොවේ

www.onlinejobs.lk

38. 'ගුග්ලිඑල්මෝ මාර්කෝනි' (Guglielmo Marconi) ප්‍රසිද්ධියක් උසුලන්නේ පහත කවරකට ද?
(1) රැහැන් රහිතව විදුලි පණිවිඩ (Wireless telegraphy) යැවීම වැඩිදියුණු කිරීම
(2) බහුරේඛ (Polygraph) සොයා ගැනීම
(3) වාෂ්ප එන්ජිම (Steam engine) සොයා ගැනීම
(4) තාපදීප්ත (Incandescent) බල්බ වැඩිදියුණු කිරීම

39. අයාචිත තැපෑල (Spam) …….. සඳහා තවත් නමකි,
(1) පෞද්ගලිකත්වයට බාධා ඇතිවීම
(2) අනවශ්‍ය ෆැක්ස් පණිවිඩ
(3) අනවශ්‍ය විද්‍යුත් තැපැල් පණිවිඩ (e-mail)
(4) ඉහත කිසිවක් නොවේ

40. 'කාපල් ටනල් සින්ඩ්‍රෝමය' ට (Carpel Tunnel Syndrome) හේතු විය හැක්කේ,
(1) අධිකව ඇතිවන චලන
(2) නොගැලපෙන චලන
(3) නැවත නැවතත් සිදුවන චලන
(4) ඉහත සියල්ල

www.onlinejobs.lk